"මානව සම්පත සඵලදායී කළමනාකරණයේ ප්‍රමුඛයා"
"வினைத்திறன் மிக்க மனிதவள முகாமைத்துவ முன்னோடி"
"Leader in effective Human Resource Management"
ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
Uva Provincial Council
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය
பிரதி பிரதான செயலாளர் (ஆளணி மற்றும் பயிற்சி) காரியாலயம்
OFFICE OF THE DEPUTY CHIEF SECRETARY (PERSONNEL & TRAINING)
රජ වීදිය, බදුල්ල    இராஜ வீதி, பதுளை    King's Street, Badulla.

ඔබේ අංකය / உமது இல. / Your No.

මගේ අංකය / எனது இல. / My No. 4/HRM/6 වා.ස්.මා. 01/ 2017

දිනය / திகதி / Date 2017.02. 06

ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්,

ඌව පළාතේ පළාත් සභාවේ සියලුම

අමාත්‍යාංශ ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

ඌව පළාතේ පළාත් සභාවේ ලේකම්,

ඌව පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,

ඌව පළාතේ සමූපකාර කොමිෂන් සභාවේ ලේකම් හා

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානින් හා ආයතන ප්‍රධානින් වෙත.

## ඌව පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2017

ඌව පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර සේවයේ තනතුරුවල 2017 වර්ෂය සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් 2017.04.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් නියෝග කරනු ලැබේ.

02. මෙම ස්ථාන මාරු නියෝගයට අනුව ස්ථාන මාරු ලැබ ඇති සියලුම නිලධාරීන්ට ලිඛිතව දැනුම් දී නියමිත දින නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකි වන සේ මුදා හැරීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු වේ.

03. එසේම අදාල නිලධාරීන්ට නියමිත දිනට පෙර නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන සේ ඔවුන් සතු රජයේ ලිපි ලේඛන, ලිපිගොනු හා රජයේ දේපළ නිසි පරිදි භාර දීමට සුදුසු නිලධාරීන්, ආයතන ප්‍රධානීන් විසින් පත් කළ යුතු අතර, ඒ අනුව නිලධාරීන් විධිමත් පරිදි නිදහස් කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ.

04. ස්ථාන මාරුවීම් ලැබ ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් මා විසින් ලිඛිතව සංශෝධනය කරනු නොලැබුවහොත්, ඔවුන් සේවයෙන් මුදා හැර ඔවුන්ගේ වැටුප් විස්තර, නිවාඩු විස්තර හා ලබාගත් දුම්රිය බලපත්‍ර පිළිබඳව විස්තර නිවැරදිව නව සේවා ස්ථානයේ ආයතන ප්‍රධානින් වෙත යැවීමට කටයුතු කළ යුතු වේ.

05. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා ඇත්නම් 2017.02.28 දිනට පෙර අදාල දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව මා වෙත ඉදිරිපත් කළ යුතු අතර, (ඇමුණුම 01 ප්‍රකාරව) එදිනට පසුව ලැබෙන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ. අභියාචනා මණ්ඩල තීරණ 2017.03.20 දිනට දැනුම් දෙනු ලැබේ.

06. මෙම ස්ථාන මාරු නියෝග අනුව, නිලධාරීන් නියමිත දිනට සේවා ස්ථාන වලින් මුදා නොහරින ආයතන ප්‍රධානීන්ට මෙම නියෝග නොතකා කටයුතු කිරීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ගාමිණී රාජකරුණා
ඌව පළාතේ ප්‍රධාන ලේකම්

පිටපත:- විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 055-2222809
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) / பிரதி பிரதான செயலாளர் (ஆளணி மற்றும் பயிற்சி) / Deputy Chief Secretary (Personnel & Training) 055-2228626
ෆැක්ස් / தொலைநகல் / Fax 055-2228700
සහකාර ප්‍රධාන ලේකම් / உதவி பிரதான செயலாளர் / Asst. Chief Secretary 055-2229425
පරිපාලන නිලධාරී / நிருவாக உத்தியோகத்தர் / Administrative Officer 055-2228627
පොදු දුරකථන අංක / பொது தொலைப்பேசி இல. / General Telephone Nos. 055-2222804, 2222810, 055-2222712
වෙබ් ලිපිනය / வலைத்தளம் / Web Site www.uvadcspt.lk
විද්‍යුත් තැපැල් ලිපිනය / மின்னஞ்சல் / E-Mail Address upcdcspt@gmail.com